**උතුරු පළාත් අධ්‍යාපන සංස්කෘතික කටයුතු ක්‍රීඩා**
**හා යෞවන කටයුතු අමාත්‍යාංශය චක්‍රලේඛ අංක** - 01/2025

මගේ අංක: **NP/03/02/GA/10/SA/CA**
අධ්‍යාපන සංස්කෘතික කටයුතු ක්‍රීඩා හා
යෞවන කටයුතු අමාත්‍යාංශය
උතුරු පළාත
2025.10.30

අධ්‍යක්ෂ
ක්‍රීඩා දෙපාර්තමේන්තුව
උතුරු පළාත

**උතුරු පළාත් පොදු සේවයේ ක්‍රීඩා පුහුණුකරු III ශ්‍රේණිය තනතුර සඳහා සීමිත පදනම මත බඳවා ගැනීම සඳහා ඉල්ලුම් පත් කැඳවීම - 2025**

අමාත්‍ය මණ්ඩල කාර්‍යාලයේ ලේකම්ගේ අංක CP/DFC/25 දරන 2025.10.16 දිනැති ලිපිය මගින් නිකුත් කර ඇති 2025.07.07 වන දින අමාත්‍ය මණ්ඩල රැස්වීමේ තීරණය ප්‍රකාර හා උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක NP/07/10/01/204 දරන 2025.09.16 දිනැති හා අංක NP/07/10/01/191(1) දරන 2025.10.15 දිනැති ලිපිවලට අනුකූලවත් උතුරු පළාත් රාජ්‍ය සේවයේ **ක්‍රීඩා පුහුණුකරු III ශ්‍රේණිය තනතුර** සඳහා පවතින පුරප්පාඩු **හතරක් (04)** සඳහා සීමිත පදනම මත බඳවා ගැනීම සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ. ඒ අනුව මෙම චක්‍රලේඛයේ සඳහන් කර ඇති සියලු සුදුසුකම් ලබා ඇති උතුරු පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා නිලධාරී තනතුරේ සේවය කරන නිලධාරීන් පමණක් මෙම තනතුරු සඳහා අයදුම් කළ හැක. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය මගින් මෙම බඳවා ගැනීම සිදු කෙරේ, මොවුනු සඳහා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය උතුරු පළාත් අධ්‍යාපන සංස්කෘතික කටයුතු ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් 2025 නොවැම්බර් මස අවසානයේ පැවැත්වීමට නියමිත බව මෙයින් දැනුම් දෙනු ලැබේ. අයදුම් පත් භාර ගැනීමේ අවසන් දිනය **2025.11.19** වේ.

## 1. බඳවා ගැනීමේ කොන්දේසි

I. උතුරු පළාත් ගරු ආණ්ඩුකාර විසින් අනුමත කර 2016.09.26 වන දින සිට බලාත්මකවන උතුරු පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාල නිලධාරීන් ඒකාබද්ද සේවයේ සේවා ව්‍යවස්ථා සටහන්වල නිර්දේශ කර ඇති කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විදිවිධාන, මුදල් රෙගුලාසි හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ අංක 1817/30 හා 2013.07.03 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශනයට පත් කරන ලද උතුරු පළාත් රාජ්‍ය සේවය සඳහා ආයතන පටිපාටි රෙගුලාසි සංග්‍රහයට යටත්ව තෝරා ගනු ලබන අයදුම් කරුවන් ක්‍රීඩා පුහුණුකරු තනතුරේ III ශ්‍රේණියට පත් කරනු ලැබේ.

II. මෙම සේවය ස්ථාන මාරුවට අදාල සේවයකි. එබැවින් මෙම පත්වීම් ලබාගන්න අය උතුරු පළාතේ ඕනෑම ස්ථානයක සේවය කළ යුතුයි යන කොන්දේසියට යටත් විය යුතුය.

III. තෝරා ගනු ලබන ක්‍රීඩා පුහුනුකරුවන් පත්වීම් දින සිට එක් වර්ෂයක කාල වැඩ බැලීමේ කාලයට යටත්වෙති. සේවා ව්‍යවස්ථාවේ 14.2 විදිවිධානවලට අනුව අදාල අවශ්‍යතාවන් සම්පූර්ණ කිරීමෙන් පසු තනතුරේ ස්ථිර කරනු ලැබේ.

IV. සේවා ව්‍යවස්ථා සං සඳහන් කර ඇති පරිදි ක්‍රීඩා පුහුණුකරු III ශ්‍රේණියට බඳවා ගත් දින සිට වර්ෂ තුනක (03) කාලය තුළ පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ සමත් විය යුතුය.

V. පත්වීම් සඳහා තෝරා ගනු ලබන අය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020ට අනුව පත්වීම් දින සිට වර්ෂ 03ක් අවසන් වීමට පෙර නියම කරන ලද දෙවන රාජ්‍ය භාෂාවෙන් සමත් විය යුතු අතර මේ සම්බන්ධයෙන් නිකුත් කරන චක්‍රලේඛවලට ඔබ යටත් විය යුතුය

VI. පත්වීම් ගණන හා පත්වීම් ක්‍රියාත්මක වන දින අද්‍යපත්වීම් නිලධාරියා විසින් නියම කරනු ලබන නමුත් දැනුම් දී ඇති පුරප්පාඩු සම්බන්ධයෙන් පුරප්පාඩුවලින් කොටසක් හෝ පුරප්පාඩු සියල්ලක්ම නොපුරවා තැබීමේ බලය පත්වීම් නිලධාරියා සතුව ඇත .

## 2. වැටුප් පරිමාණය

2025.03.25 වන දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 ට අනුව වැටුප් ඛණ්ඩය MN3 - 2025 ට අනුව ක්‍රීඩා පුහුණුකරු තනතුර III වන ශ්‍රේණිය සඳහා ඒකාබද්ධ වැටුප් පරිමාණය **රු.52,250 - 10x800 - 11x 1190 - 10x 1320 - 10 x 1350 – 100,040/=** වේ. (III වන ශ්‍රේණියට බඳවාගෙන අවුරුදු තුනක් පසුවීමට පෙර පළමුවන කාර්යක්ෂමතා විභාගයේ සමත් විය යුතුය. කෙසේ වුවත් උක්ත චක්‍රලේඛයේ III තේ ලේඛන සඳහන් කර ඇති විදිවිධානවලට අනුව නියම කර ඇති වැටුප මෙම තනතුර සඳහා ගෙවනු ලැබේ,

## 3. සුදුසුකම්

**I. අධ්‍යාපන වෘත්තියට අදාල සුදුසුකම් හා පළපුරුද්ද**

උතුරු පළාත් ක්‍රීඩා දෙපාර්තදෙන්තුවෙ ක්‍රීඩා නිලධාරි තනතුරේ අවුරුදු 08ක් සතුටුදායක හා සක්‍රිය සේවා කාලය සම්පූර්ණ කළ ක්‍රීඩා නිලධාරි තනතුරේ ස්ථිර කරන ලද නිලධාරියෙක් විය යුතුයි

II. ජාතික ක්‍රීඩා අමාත්‍යාංශය විසින් පිළිගත් ආයතනයක අදාල ක්‍රීඩා සඳහා පවත්වනු ලබන මාස තුනකට (03) අඩු නොවන පුහුණුකරු ඩිප්ලෝමා පාඨමාලාවෙ සමත්වී තිබීම හෝ ක්‍රීඩා පනත යටතේ නියමිත ක්ෂේත්‍රයට අදාල ජාත්‍යන්තර හෝ දේශීය ක්‍රීඩා සමිති විසින් නිකුත් කරන ලද පුහුණුකරු අවසර පත්‍රයක් ලබාගෙන තිබිය යුතුය

**III. ශාරීරික යෝග්‍යතාව**

උතුරු පළාතේ ඕනෑම ස්ථානයකම සේවය කිරීමටත් තනතුරේ වගකීම් ක්‍රියාත්මක කිරීමටත් ශාරීරිකව හා මානසිකව යෝග්‍යතා ඇති කෙනෙක් විය යුතුයි

**IV. වෙනත් සුදුසුකම්**

a. පිළිගත් කාර්ය සාධන තක්සේරු ප්‍රමිතීන්ට අනුකූලව සුදුසුකම් පරීක්ෂා කරන දිනට පෙර වර්ෂ අටක් (08) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට වඩා ඉහළින් පෙන්නුම් කර තිබිය යුතුය

b. පසුගිය වසර 05 තුළ සතුටුදායක හා සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය

c. රාජ්‍ය භාෂා පිළිබඳ අදාල මට්ටමේ ප්‍රවීනතාවයක් සම්පූර්ණ කර තිබිය යුතුය

d. අයදුම් පත් කැඳවන චක්‍රලේඛයේ සඳහන් අවසන් දිනය වන විට 3 වන කොටසේ සඳහන් සියලුම සුදුසුකම් සපුරා තිබිය යුතුය

4. **බඳවා ගැනීමේ ක්‍රමය**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය මගින් කුසලතා මත පදනම්ව හා බඳවා ගැනීමේ අවස්ථාවේදී බලපවත්වන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, සේවා ව්‍යවස්ථා, බඳවා ගැනීමේ පරිපාටිය හා ජාතික හා පළාත් ප්‍රතිපත්තිවලට අනුකූලව ක්‍රීඩා පුහුණුකරු III වන ශ්‍රේණිය තනතුරු සඳහා බඳවා ගැනීම සිදු කරනු ලැබේ. මෙම දැන්වීමේ අයදුම් කරුවන්ගෙන් ඉල්ලා ඇති සුදුසුකම් සියල්ල සම්මුඛ පරීක්ෂණයේදී පරීක්ෂා කරනු ලැබේ. බඳවා ගැනීමේදී හෝ බඳවා ගැනීමෙන් පසුව අවශ්‍ය සුදුසුකම් නොමැති බව දැනගත්තොත් මෙම තනතුර සඳහා හිමිකම් අවලංගු කරනු ලැබේ.

5. **අයදුම් කරන ක්‍රමය**

5.1 මෙම දැන්වීම සමග පළ කර ඇති අයදුම් පත සම්පූර්ණ කර එය 2025.11.19 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "ලේකම්, පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය, උතුරු පළාත, චෙම්මනි වීදිය, නල්ලූර්, යාපනය" යන ලිපිනයට තමන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් යැවිය යුතුයි. දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් නිර්දේශ කර නොමැති අයදුම් පත් භාර ගනු නොලැබේ.

5.2 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසුකම් ලත් අයදුම් කරුවන්ට සම්මුඛ පරීක්ෂණ සඳහා ලිපිය පළාත් අධ්‍යාපන සංස්කෘතික කටයුතු ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් යවනු ලැබේ.

5.3 නියම පිරිදි අයදුම් පත සම්පූර්ණ කිරීමට නොහැකි වීමෙන් සිදු වන බලපෑම සඳහා අයදුම් කරුවන් වග කිව යුතුය

5.4 අයදුම් කරුවන්ගේ අයදුම් පත් ලැබීම සම්බන්ධව කිසිදු දැනුම් දීමක් කරනු නොලැබේ. කෙසේත් අයදුම් පත් කැඳවා ඇති දිනට පෙර ඉල්ලා ඇති සුදුසුකම් සම්පූර්ණ කර නොමැති අයදුම් පත් කිසිදු පෙර දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කළ හැකිවන අතර ප්‍රතික්ෂේප කරන ලද අයදුම් පත් සම්බන්ධව අදාල අයදුම් කරුවන් වෙත දැනුම් දෙනු ලැබේ.

6. **අසත්‍ය තොරතුරු සඳහා අඩුවම්**

අයදුම් පත සම්පූර්ණ කිරීමේදී ඉතා පරිස්සමෙන් නිවැරදි තොරතුරු ලබාදිය යුතුයි. මෙම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා නීතිරීතිවලට අනුව ඕනෑම අයදුම් කරු කෙනෙක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙර හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් පසුව හෝ කිසියම් අවස්ථාවක සුදුසුකම් නොමැති කෙනෙක් බව දැන ගතහොත් ඔහුගේ විභාග අපේක්ෂක අයිතිය එම අවස්ථාවේ අවලංගු කරන අතර ඉදිරිපත් කරන ලද යම් තොරතුරක් අසත්‍ය බව දැන ගතහොත් ඕනෑම අවස්ථාවක ඔහු විනයානුකූල කටයුතුවලට ඔහු / අය යටත් වනු ඇත

7. **අනන්‍යතාවය ඔප්පු කිරීම**

අයදුම්කරුගේ අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා පහත සඳහන් ලිපිලේඛනවලින් එකක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කළ යුතුයි

අ) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තු විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම් පත
ආ) වලංගු ගමන් බලපත්‍රය
ඇ) වලංගු රියදුරු අවසර පත්‍රය

## 8. අත්සන සහතික කිරීම

සෑම අයදුම් කරුවෙක්ම අයදුම් පත්‍රයේ තමන්ගේ අත්සන සහතික කිරීම අනිවාර්යවේ. අයදුම් කරු තමාගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් අත්සන් කිරීමට බලය ඇති කෙනෙක් මගින් පමණක් අත්සන සහතික කරගත යුතුයි.

## 9. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් විෂයයන් සම්බන්ධයෙන් ලකුණු දෙනු ලැබේ (එකතුව ලකුණු 100යි)

| අංක | විෂය | ලකුණු ලබාදෙ ක්‍රමය | උප කොටස් සඳහා උසස් ලකුණු | වැඩිම ලකුණු |
|---|---|---|---|---|
| **01 ජ්‍යෂ්ඨත්වය** | | | | |
| | ක්‍රීඩා නිලධාරී පත්වීමේ වර්ෂ අටක (08) සතුටුදායක හා සක්‍රිය සේවයෙන් පසු ජ්‍යෂ්ඨත්වය | වර්ෂයට ලකුණු තුනයි (03) මාස හයකට වැඩිනම් එක (01) ලකුණයි | 20 | ලකුණු 20 |
| **02 ක්ෂේත්‍රයට අදාල අමතර අධ්‍යාපන සුදුසුකම්** | | | | |
| **අංක** | **විෂය** | **ලකුණු ලබාදෙ ක්‍රමය** | **උප කොටස් සඳහා උසස් ලකුණු** | **වැඩිම ලකුණු** |
| 2.1 | ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාල පිළිගත් විශ්ව විද්‍යාල උපාධිය හෝ ඊට වැඩි සුදුසුකම් | 15 | 15 | ලකුණු 15 |
| 2.2 | ක්‍රීඩා පරිපාලනය ක්‍රීඩා කළමනාකරණය වගේ ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාල සාමාන්‍ය පාඨමාලා පහත සඳහන් කාල සීමාවල ඇතුළත් විය හැකි කිසියම් වෙන් වෙන්ව විෂයයන් 03 සඳහා ලකුණු ලබාදෙනු ලැබේ | **ලකුණු ලබාදෙ ක්‍රමය** | 05 | |
| | මාස හය (06) හෝ ඊට වැඩි | ලකුණු හතරයි (04) | | |
| | මාස තුන (03) හෝ ඊට වැඩි | ලකුණු දෙකයි (02) | | |
| | මාසයක් (01) හෝ ඊට වැඩි | ලකුණු එකයි (01) | | |
| | දින තුනක් (03) හෝ ඊට වැඩි | ලකුණු 0.5 | | |
| **03 අමතර වෘත්තිමය සුදුසුකම්** | | | | |
| **අංක** | **විෂය** | **ලකුණු ලබාදෙ ක්‍රමය** | **උප කොටස් සඳහා උසස් ලකුණු** | **වැඩිම ලකුණු** |
| 3.1 | පුහුණු කිරීම සම්බන්ධයෙන් උසස් පාඨමාලා එකක් සඳහා මාස හය (06) හෝ ඊට වැඩි | 15 | 04 | ලකුණු 15 |
| 3.2 | එක් ක්‍රීඩාවක් සඳහා පුහුණු කිරීමේ අවසර පත්‍රය ලබාගෙන තිබීම (Grade Level) | | 05 | |
| | Grade A Level III | ලකුණු පහයි (05) | | |
| | Grade B Level II (coaching) | ලකුණු තුනයි (03) | | |
| | Grade C Level I | ලකුණු එකයි (01) | | |
| **අංක** | **විෂය** | **ලකුණු ලබාදෙ ක්‍රමය** | **උප කොටස් සඳහා උසස් ලකුණු** | |
| 3.3 | ජාත්‍යන්තර / ජාතික / පළාත් මට්ටමේ විවෘත තරගවල හෝ ජාත්‍යන්තර / ජාතික ක්‍රීඩා සමිති විසින් පවත්වන ලද ජ්‍යෂ්ඨ මට්ටමේ මලල ක්‍රීඩා තරගවල විනිශ්චයකරු / තීරක / තාක්ෂණික නිලධාරී රාජකාරී ඉටු කිරීම (පහත සඳහන් සෑම මට්ටමේ තරගවල වෙන් වෙන්ව වැඩිම වශයෙන් ක්‍රීඩා ඉසව්ව තුනක් සැලකිල්ලට ගනු ලැබේ | | 06 | |
| | 1 ජාත්‍යන්තර මට්ටමේ තරග | 3 x 2 = 6 | | |
| | 2 ජාතික මට්ටමේ තරග | 3 x 1.5 = 4.5 | | |
| | 3 පළාත් මට්ටමේ තරග | 3 x 1 = 3 | | |

| 04 ක්‍රීඩා නිලධාරි පත්වීමෙන් පසුව පෙන්නුම් කර ඇති විශේෂ දක්ෂතා (ජාතික ක්‍රීඩා උත්සවයේ ඇතුළත් කරන ලද ක්‍රීඩා සඳහා පමණයි) | | | | | | |
|---|---|---|---|---|---|---|
| අංක | විෂය | ලකුණු නියුත් කිරීමේ ක්‍රමය | | | උප කොටස් සඳහා උසස් ලකුණු | වැඩිම ලකුණු |
| 4.1 | ජාත්‍යන්තර මට්ටමේ තරඟයේ (කලාපීය පොදු රාජ්‍ය මණ්ඩල ලෝක කුෂලාන ඔලිම්පික්) ජයගත් ජාතික කණ්ඩායම් (තනි, කණ්ඩායම්) සම්බන්ධයෙන් වගකීම් දැරීම සඳහා | රන් | රිදී | ලෝකඩ | 20 | ලකුණු 45 |
| | පුහුණුකරු | 04 | 03 | 02 | | |
| | සහකාර පුහුණුකරු | 02 | 1.5 | 01 | | |
| 4.2 | ජාතික ක්‍රීඩා අමාත්‍යාංශය විසින් පවත්වනු ලබන ජාතික මට්ටමේ තරඟයේ දිනාගත් පළාත් කණ්ඩායම් (තනි, කණ්ඩායම්) සම්බන්ධයෙන් පහත සඳහන් වගකීම් දැරීම සඳහා | රන් | රිදී | ලෝකඩ | 15 | |
| | පුහුණුකරු | 04 | 03 | 02 | | |
| | සහකාර පුහුණුකරු | 02 | 1.5 | 01 | | |
| 4.3 | ජාතික ක්‍රීඩා සංගම් විසින් පවත්වන ලද ජ්‍යෙෂ්ඨ මට්ටමේ මලල ක්‍රීඩා තරඟ සඳහා (ජාතික මට්ටම) | | | | 10 | |
| | පුහුණුකරු | 03 | 02 | 01 | | |
| 4.4 | ප්‍රාදේශීයල දිස්ත්‍රික් හෝ පළාත් මට්ටමේ අවසාන වර්ෂ 05ක් තුළ ක්‍රීඩා නිලධාරි විසින් සංවිධාන කරන ලද රැ සිදු කරන ලද විශේෂ ඉදිරි කටයුතු | සෑම වර්ගයේ සෑම ක්‍රියාකාරකම් සඳහා ලබාදෙන ලකුණු | සෑම ප්‍රවර්ගයේ සැලකිල්ලට ගන්න උපරිම ක්‍රියාකාරකම් ගණන | | 05 | |
| | 1 පුහුණු කඳවුරු (coaching camps) | 0.5 | 06 | | | |
| | 2 විශේෂ ක්‍රීඩා තරඟ | 0.5 | 04 | | | |
| | 3 ක්‍රීඩා ක්ෂේත්‍ර නිර්මාණ | 0.5 | 04 | | | |
| | ක්‍රීඩා සමාජ ක්‍රියාකාරකම් | සෑම වර්ගයේ සෑම ක්‍රියාකාරකම් සඳහා ලබාදෙන ලකුණු | සෑම ප්‍රවර්ගයේ සැලකිල්ලට ගන්න උපරිම ක්‍රියාකාරකම් ගණන | | 05 | |
| | අවසාන වර්ෂ 05ක් තුළ ක්‍රීඩා සමිතිවල කරන ලද අභ්‍යන්තර තරඟ කටයුතු / නවෝත්පාදන කටයුතු / දැනුවත්භාව කටයුතු | 0.25 | 20 | | | |
| 4.5 | සම්මුඛ පරීක්ෂණයේ පෙන්නුම් කළ පෞරුෂය සන්නිවේදන කුෂලතා නායකත්ව ලක්ෂණ | | | | ලකුණු 05 | |
| එකතුව | | | | | ලකුණු 100 | |

**වෙනත් කොන්දේසි**

10 ක්‍රීඩා නිලධාරිගේ ඒකාබද්ධ සේවයේ ක්‍රීඩා නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීමේදි ඉදිරිපත් කරන ලද මූලික සුදුසුකම් සඳහා සහතිකවලට නැවත ලකුණු දෙනු නොලැබේ.

11 මෙම දැන්වීමේ සඳහන් කර ඇති හෝ සඳහන් කර නොමැති විෂයයන්වල අදහස් කරන හෝ අදහස් නොකරන යම් අපැහැදිලිවීම සම්බන්ධයෙන් හෝ වෙනස් කිරීම එවගෙම කිසියම් විශේෂ කරුණු නිසා නියමිත ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමට නොහැකි වන අවස්ථාවේ ඒ සම්බන්ධව උතුරු පළාත් අධ්‍යාපන සංස්කෘතික කටයුතු ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් ගනු ලබන තීරණය අවසාන තීරණයවේ

12 මෙම තනතුර සඳහා පුරප්පාඩු පිරවීමේදී එම පුරප්පාඩු පිරවීම සම්බන්ධයෙන් අවසාන තීරණය උතුරු පළාත් අධ්‍යාපන සංස්කෘතික කටයුතු ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් සිදු කරනු ලැබේ.

13 දෙමළ හා සිංහල භාෂාවල ප්‍රකාශනය කෙරෙන මෙම චක්‍රලේඛයේ භාෂා අතර යම් වෙනසක් ඇතිවන අවස්ථාවේ දෙමළ භාෂාවේ චක්‍රලේඛය ප්‍රමුඛ පව ගනු ලැබේ

**සැලකිය යුතුයි**

1. මෙම දැන්වීම ඔබ දෙපාර්තමේන්තු යටතේ සේවය කරන සුදුසුකම් ඇති සියලු නිලධාරීන්ගේ දැනගැනීමට යොමු කරන්න

2. මෙම බඳවා ගැනීම සම්බන්ධ දැන්වීම් www.np.gov.lk යන උතුරු පළාත් සභාවේ අන්තර්ජාල හා උතුරු පළාත් අධ්‍යාපන සංස්කෘතික කටයුතු ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ www.edumin.np.gov.lk අන්තර්ජාලවල බලාගත හැකිය.

3. මෙම චක්‍රලේඛයේ සඳහන් කර ඇති විදිවිධාන සම්බන්ධයෙන් කිසියම් පැහැදිලි කිරීමක් අවශ්‍ය නම් උතුරු පළාත් අධ්‍යාපන සංස්කෘතික කටයුතු ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ පාලන අංශයේ 021-2220039 දුරකථන අංක මගින් සම්බන්ධ කළ හැකිය

**එම් පැට්‍රික් ඩිරන්ජන්**
ලේකම්
උතුරු පළාත් අධ්‍යාපන සංස්කෘතික කටයුතු ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ
උතුරු පළාත
2025.10.30

M. Patrick Diranjan
Secretary,
Ministry of Education,
Cultural Affairs, Sports & Youth Affairs
Northern Province